3 වන පිටෙන්

නිවස ගිනි තබා ඇය මහ මගට ඇද දමා ලොකු ආතල් එකක් ගත් හ.

කැටයම් චින්තකත් කුඩා දරුවන් දෙදෙනෙකුගේ පියෙකි. ඔවුන්ට ද අසන්නට ලැබෙන්නේ සිය පියාගේ බිහිසුණු මරණයයි. සමාජය ඒ මරණය සමරන ප්‍රීතියයි.

කැටයම් චින්තක බෞද්ධයකු බව දැන ගන්නට තිබේ. ඔහුගේ පාංසකූලයට කිසිදු හාමුදුරු නමක් පැමිණ නැත. පැමිණියේ නම්, අනතුරට ලක් වන්නට ඉඩ තිබුණු නිසා ද විය හැකි ය.

කැටයම් චින්තක ද ඝාතනයට ලක් වූ පොලිස් නිලධාරියා ජීවත් වූ ගමේ ම ජීවත් වූ අයෙකි. ඔහු මැරවරයකු වන්නට පුළුවන. මෙම මිනීමැරුම කළා වන්නට ද පුළුවන. එහෙත්, ඔහුට ද කියන්නට

*ශිෂ්ට සමාජයක් දණ්ඩනය භාවිතා කරන්නේ නිවැරදි කිරීම පිණිස ය. සතුටු වීම පිණිස නො වේ.*

කතාවක් තිබෙනවා විය හැකි ය.

කැටයම් චින්තක යනු ජනමාධ්‍යවලට නම් අති භයානක, කෲර මිනීමරුවෙකි. එහෙත්, ඇත්තම කියනවා නම්, ඒ පැත්තේ වැඩි දෙනෙක් ඒ මිනිහා ගැන දන්නේ කොළඹ ජනමාධ්‍යවලින් ඔහු ගැන කී දේ පමණි.

මේ අන්දමින් ඔබ දන්නා ඕනෑම කලහකාරී පුද්ගලයෙක් යක්ෂයකු බවට පත් කර සමාජ වෛරයට ලක් කරන්නට ජනමාධ්‍යවලට පුළුවන. අවශ්‍ය වන්නේ යම් සමාජ විරෝධී ක්‍රියාවක් පිළිබඳ චෝදනාවක් පමණි.

මෙහි භයානක ම තත්වය වන්නේ මානව හිමිකම් සංවිධාන පවා මෙම තත්වය පිළිබඳ මුනිවත රැකීමයි.

කඹුරුපිටියේ පොලිස් නිලධාරියා මරා දැමූ මිනීමරු-වනුත්, කැටයම් චින්තකගේ බිහිසුණු මරණය දැක කිරිබත් කෑ මිනිසුනුත් අතර මම නම් කිසිදු වෙනසක් නො දකිමි. දෙපිරිස ම එක සමාන ම්ලේච්ඡයෝ වෙති. කොහොමත්, ශිෂ්ටත්වයත්, ම්ලේච්ඡත්වයත් අතර තිබෙන්නේ කෙස් ගසක වෙනසක් බව මගේ අදහසයි.

ශිෂ්ට සමාජයක් දණ්ඩනය භාවිතා කරන්නේ නිවැරදි කිරීම පිණිස ය. සතුටු වීම පිණිස නො වේ.

හෙට ඔබේ අතින් හෝ ඔබ දන්නා හඳුනන වෙනත් කෙනෙකු අතින් යම් වරදක් සිදු විය හැකි ය. ඔබව විනිශ්චය කිරීම ජනප්‍රිය මතයට භාර දෙනවා ද නැතිනම් අධිකරණයට භාර දෙනවා ද යන්න ඔබ තීරණය කරන්න.


එඩ්වඩ් ස්නෝඩන්

# හා හා බලාගෙනයි...

## ගූගල්, ෆෙස්බුක්, ඇපල්, මයික්‍රොසොෆ්ට්, යාහූ, ඒ.ඕ.එල්. හරහා ඇමරිකාව ඔබ දෙස බලා සිටියි

සුමුදු තිවංක ගමගේ

බිග් බ්‍රදර් - ඕෂනියාවේ සුපිරි බලය හොබවන ඒකාධිපතියා, ටෙලිස්ක්‍රීනයන් මගින් සිය වැසියන් දෙස බලා සිටියි. Big Brother is Watching You යන පාඨය මගින් ඒ බැව් එකී වැසියන්ට නිරන්තරයෙන් ම සිහිපත් කර දෙයි. ජනතාව කන්නේත්, බොන්නේත්, සිරුරු කිස කරන්නෙත්, රමණය කරන්නේත් ආණ්ඩුව ඔවුන් දෙස බලාගෙන සිටියදීය. එපුවත එන්නේ, ජෝජ් ඕවල් විසින් ලියන ලද "1984" නවකතාවේය. ටෙලිස්ක්‍රීනය යනු ඕවල් මැවූ කල්පිත උපකරණයකි. එය එක් විටම ටෙලිවිෂනයක් මෙන්ම ආරක්ෂක කැමරාවක් ලෙස ද ක්‍රියා කරයි. ඕෂනියාවට එරෙහි ඊනියා රහසිගත කුමන්ත්‍රණවලට ඉඩ ඇහිරීම ගුප්ත ඒකාධිපතියාගේ අරමුණයි...( ඉතින්, ඕවල් 1949 දී ලියූ දෑ යථාර්ථයක් බවට පත් වූ ලෝකයක මේ වන විටත් අප දිවි ගෙවන බව, එඩ්වඩ් ස්නෝ ඩන් හෙළි කළ දෑ දන්නා ඕනෑම අයෙකු දන්නා දෙයකි.

ඔබගේ ජීවිත කාලය තුළ කරන කියන සියළු දෑ පටිගතව ඇත්නම්...? ඔබගේ සුභ සිද්ධිය සඳහා යැයි කියමින් කිසියම් වරප්‍රසාදිත පිරිසක් ලෝකයේ සියලූම පුද්ගලයින්ගේ අන්තර්ජාල ජීවිතය නරඹමින් සිටීත් නම්...?
ජාලගත සුරක්ෂිතභාවය ගැන දිව්‍යමය පොරොන්දු දුන් වෙළඳ සමාගම්, සිය පාරිභෝගික "රජවරුන්"ගේ (Customer is the king යනු මො-වුන්ගේම උදාන වැකියකි) පුද්ගලිකත්වය, අමු අමුවේ උල්ලංඝනය කොට එය ආණ්ඩුවලට පාවා දෙනවා නම්....?
...එවිට ඔබට හැගෙන්නේ කෙසේද?

ඇමරිකාවේ CIA සංවිධානයට අනුබද්ධව සේවය කරමින් සිටි එඩ්වඩ් ස්නෝ ඩන් විසින් හෙළිදරව් කරන ලද පරිදි ඇමරිකානු ජනාධිපතිවරයාගේ සිට සියළුම පුද්ගලයන්ගේ දත්ත ඇතුලත් ගූගල්, ෆෙස්බුක්, ඇපල්, මයික්‍රොසොෆ්ට්, යාහූ, ඒ.ඕ.එල්. වැනි සියළුම සමාගම් සතුව පවතින එම සමාගම් වල නිෂ්පාදන පරිහරණය කරන්නන්ගේ දත්ත වලට කොන්දේසි විරහිතව ඇතුලත්

*ඉන්දියාව ද රාජ්‍ය සේවකයනට ජීමේල් ගිණුම් භාවිතාවෙන් ඉවත්වන ලෙසට දන්වා ඇත. එමෙන්ම රාජ්‍යතාන්ත්‍රිකව වැදගත් ලියුම් පරිගණක භාවිතයෙන් තොරව ටයිප්රයිටර භාවිතාවෙන් සිදුකරන ලෙසට ද ලන්ඩනයේ රාජ්‍ය නිලධාරීන් හට ඉන්දියානු රජය දැනුම්දී ඇත.*

වීමට ඇමරිකාවේ ජාතික ආරක්ෂක ඒජන්සිය (NSA) විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රිස්ම් නම් ව්‍යාපෘතියට අවසර ලැබී ඇත. ඇමරිකාවේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ලෝකයේ සියළුම මනුෂ-යයින්ගේ පෞද්ගලිකත්වය පාවා දීමට අනෙකුත් රටවල් සියල්ල සූදානම්ද?

අප බොහෝ දෙනෙකු විසින් පරිහරණය කරන නොමිලේ ලැබෙන ඊමේල් හා අනෙකුත් දත්ත ගබඩා කර තිබෙන සර්වර් සියල්ල පිහිටා තිබෙනුයේ අදාළ සමාගම් සතුවය. (කකදමා කදපචමඑසබට ැරඩසපජි) මෙකී සමාගම් බහුතරයක් ඇමරිකාවේ පිහිටා තිබේ. ගූගුල්, ෆෙස්බුක්, මයික්‍රොසොෆ්ට්, යාහූ, ඇපල් මීට හොඳම උදාහරණය. දැනට අනාවරණය කොට ඇති පරිදි ඇමරිකානු රාජ්‍ය තුළ පවතින මෙම සියළු සමාගම් විසින් තමන් සතු දත්ත සියල්ල වෙත පිවිසීමට හී වෙත ඉඩකඩ ලබාදී ඇත. ස්නෝඩන්ගේ අනා-වරණයන්ට අනුව, ජාතික ආරක්ෂාවට සම්බන්ධ යැයි පවසමින් මෙම තොරතුරු වෙත පිවිසීමට අවස්ථාව ලැබුණ ද ඒවායේ රහසිගතභාවය හෝ පුද්ගලිකත්වය සුරැකෙනුයේ එකී දත්ත පරිහරණය කරන පුද්ගලයාට සාපේක්ෂවය. එය හරියටම කියනවා නම් ඔබගේ ලිංගික හැසිරීම්, ඔබ ශරීරකෘත්‍යය සිදුකරන ආකාරය, ඔබ විසින් අතිශය පුද්ගලිකව සිදුකරන සියලූ දෑ තවෙකෙකු විසින් පටිගත කොට නරඹමින් වින්දනයක් ලබනවා වැනිය. සභ්‍ය ලෝකයේ මානසික ව්‍යාධීන්යැයි කාණ්ඩ කොට ඇති දේ ලෝකයේ දියුණුම යැයි පවසන රාජ්‍යය විසින් නීතිගත කොට ඇත්තේ මෙලෙසය. උත්ප්‍රාසජනක ලෙස එකී අපරාධය වසන් කරගැනීමට ඔවුන් යොදා ගන්නේ ද සියළු රාජ්‍ය ත්‍රස්තවාදයන් ආවරණය කර ගැනීමට ලංකාවේ යොදා ගැනෙනා "ජාතික ආරක්ෂාව" නමැති ගමරාළගේ වංගෙඩියම ය...(

එඩ්වඩ් ස්නෝඩන්ගේ හෙළිදරව්ව මුලින්ම වාර්තා කළ එක් ආයතනයක් වූ වොෂින්ටන් පෝස්ට් පුවත්පත විසින් සිදුකළ සමීක්ෂණයකට අනුව ඇමරිකානු ප්‍රිස්ම් ව්‍යාපෘතිය පිළිබඳව හෙළිදරව්වෙන් පසුව එරට වැසියන්ගේ අන්තර්ජාල පරිහරණයේ සිදුව ඇති වෙනස්කම් දක්වා ඇත. ඒ අනුව ප්‍රධාන ධාරාවේ සමූහ

7 වන පිටට

සන්නස Cartoon by PK

